පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - **492**

ආයතනයේ නම :- වයඹ පළාතේ පළාත් සභාව යටතේ වූ පාලන ආයතන

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டு தொடர் இலக்கம் - 492

நிறுவனத்தின் பெயர் - *வடமேல் மாகாண சபையின் கீழுள்ள உள்ளூராட்சி மன்றங்கள்*

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்பட்டும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No. - 492

Name of the institution :- Local Authorities under the North Western Provincial Council

Submission of observations of Hon. Minister and steps taken with regard to the Reports tabled by the committee on Public Accounts in terms of standing Order No. 119(4)

ආකෘති (අංක 01)

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 492

ආයතනයේ නම : කුරුණෑගල මහ නගර සභාව

කමිටුව විසින් හඳුනාගන්නා ලද දුර්වලතා	**දුර්වලතා මඟ හරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය**
පළමු කොටස 71.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	මතය ව්‍යාවනය කර ඇත. මතය යහපත් මතයක් බවට පත්කර ගැනීම සඳහා ගිණුම්කරණ අඩුපාඩු හා අනෙකුත් අඩුපාඩු අවම කර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන ඇත.
බඩු වට්ටෝරු ලේඛනය/ පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.
ඉඩම් කට්ටිකර විකිණීමේ බදු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ලෙජරය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.
සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රසම්පාදන සැලැස්මක් නියමිත දිනයට අනුමත කර ගෙන නොතිබුණි.	සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රසම්පාදන සැලැස්මක් අනුමත කරගෙන ඇත. එය නියමිත දිනට සිදු කර නොමැති බව පිළිගනිමි. ඉදිරියේ දී නියමිත දිනට අනුමත කර ගැනීමට කටයුතු කරමි.
විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු සපයා නොතිබුණි.	2023 වර්ෂයේ සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දී ඇත.
භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි.	මේ වන විට භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාලවකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2023 වර්ෂයට අදාළව නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 08 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	අවශ්‍ය අනුමැතීන් සඳහා මුදල් අමාත්‍යාංශයට ලිපි යොමු කරන ලදි. මේ වන විට මුදල් අමාත්‍යාංශයෙන් රේගු අධිකාරියට හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ලිපිය යොමු කර ඇති බවට දන්වා ඇත.
සියලු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි.	මේ වන විට සියළුම වාහන සඳහා රාජ්‍ය ලාංඡනය පින්තාරු කර ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරවම මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් මේ වනවිට නිරවුල් කර ඇත.

වර්ෂයට අදාළව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	මේ වන විට හිඟ ආදායම් අය කිරීම ප්‍රශස්ථ මට්ටමක පවති.
ටෙන්ඩර් මත වාර්ෂිකව බදු දිය යුතු සභාවේ දේපළ සමාලෝචිත වර්ෂය තුළදී එසේ සම්පූර්ණ ලෙස බදු දී නොතිබුණි.	වාර්ෂික බදු දීම් මහා නගර සභාව තුල මේ වන විට ක්‍රියාත්මක නොවේ. එම දේපල බදු දීම සඳහා මහා සභාව විසින් තීරණය කරනු ලබන නිශ්චිත කාලයට බදු ලබා දීම් සිදු කෙරේ.
දෙවැනි කොටස 88.00	
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	මේ වන විට අවස්ථාව සලසා දී ඇත.
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි.	අපද්‍රව්‍ය රැස් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.
වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස්කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අයකර නොතිබුණි.	මහා නගර සභාව විසින් ගාස්තු අය නොකරනු ලබයි.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	මේ වනවිට 2023 වසරේ කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගත වී ඇත.
විගණන වාර්තාවේ නිර්දේශ කර ඇති ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට එම නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.

ආකෘති (අංක 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා : 492

ආයතනයේ නම : කුලියාපිටිය නගර සභාව

කමිටුව විසින් හඳුනාගන්නා ලද දුර්වලතාවය	**දුර්වලතා මඟහරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය**
පළමු කොටස-93.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	2023වර්ෂය සඳහා ජ්‍යෙෂ්ඨ විගණකාධිපතිගේ අංක NWLG/KR/B/Kuliuc/05/2023/13 හා 2024.05.31 දිනෙන් විගණකාධිපතිගේ සම්පිණ්ඩන වාර්ථාව මගින් තත්වාගණනය කල මතයක් ඉදිරිපත් කර ඇත
මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස්කර නොතිබුණි	ඉදිරියේදී මුර පදය වෙනස් කිරීමට කටයුතු කරනු ලැබේ.
සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙලකොට සභා සම්මත කර නොතිබුණි.	2026 -2029 සංයුක්ත සැලැස්ම අනුව 2026 ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර සභා සම්මුතිය ලබාගෙන ඇත.
සියළු වාහන වල රාජ්‍ය ලාංචනය පින්තාරුකර නොතිබුණි.	ඉදිරියේදී රාජ්‍ය ලාංඡනය පින්තාරු කිරීමට කටයුතු කරනු ලැබේ.
හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් කර නොතිබුණි.	හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා පහත පරිදි කටයුතු කර ඇත. දෛනිකව වරිපනම් එකතු කර ගැනීමට සේවකයකු යොදවා වර්ෂය පුරා වරිපනම් එකතු කර ගැනීමට කටයුතු කිරීම. නගරසභා ආඥා පනතේ 170 වගන්තිය අනුව කටයුතු සිදුකර හිඟ වරිපනම් නොගෙවූ අයවෙත රතු නිවේදන නිකුත් කිරීම. හිඟ ආදායම් අයකර ගැනීම සඳහා ජංගම සේවාවන් ක්‍රියාත්මක කර ඉදිරි හිඟ අයකරගැනීමට කටයුතු කිරීම. ඒ අනුව හිඟ වරිපනම් ඉහත පරිදි අයකර ගැනීමට කටයුතු කරන බැවින් වරෙන්තු නිකුත් කිරීමට කටයුතු කර නොමැත.

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 79

ආයතනයේ නම : පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගන්නා ලද දුර්වලතා	**දුර්වලතා මඟ හරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය**
පළමු කොටස : 87.00	
ආයතනයේ ගිණුම් පිළබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළබඳ විගණන මතය ,යටත්ව මට්ටමේ ඇත.
ගල් හා බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ගල් හා බොරළු ලේඛනය ඉදිරියේ දී නිසි පරිදි යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ
මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස්කර නොතිබුණි.	මෘදුකාංගයට අදාළ මුරපදය ඉදිරියේ දී යාවත්කාලීන කිරීමට කටයුතු කරමි.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4 ක් වත් පවත්වා නොතිබුණි.	ඉදිරියේ දී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරමි.
පවරා නොගත් වත්කම් තිබුණි.	අදාළ පවරා නොගත් වත්කම්(ඉඩම් හා ගොඩනැගිලි) නිවැරදිව හඳුනාගැනීමටත්,ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති සභාව වෙත පැවරිය යුතු රජයේ ඉඩම් හා ගොඩනැගිලි අදාල ප්‍රාදේශීය ලේකම් වෙතින් විධිමත්ව සභාව සතු කර ගැනීමටත්,පෞද්ගලික අංශයේ හා වෙනත් ආයතනවලින් පැවරිය යුතු වත්කම් පවරා ගැනීම සඳහා නීති උපදෙස් මත කටයුතු කරමින් පවතින බවත් කාරුණිකව සඳහන් කරමි
වර්ෂයට අදාළව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය	හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත.
හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් කර නොතිබුණි	රතු නිවේදන නිකුත් කර දේපල තහනම් වැඩසටහන් පවත්වා ඇත
ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවරීමක් සිදු කර නොතිබුණි	ලිඛිත දැනුම් දීම් හා දුරකථන දැනුම් දීම් මඟින් අදාල අයකිරීම් සිදුකර ඇති බැවින් නඩු පැවරීම් සිදුකිරීමට අවශ්‍ය නොවුණි
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි	මේ වන විට වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට අවශ්‍ය තාක්ෂණ උපදෙස් ලබා ගනිමින් පවතින

	අතර ඉන් අනතුරුව වෙබ් අඩවිය නිර්මාණය කිරීමට කටයුතු කරමින් පවතී
දෙවැනි කොටස - 90.00	
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි	පවත්නා බ්ලොක් අඩවියේ එම පහසුකම් නොමැත.නිර්මාණය කරමින් පවතින වෙබ් අඩවියෙහි එම පහසුකම නිර්මාණය කර ඇත.
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිළිවෙළක් නොතිබුණි .	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කර ගබඩා කිරීමට ප්‍රමාණවත් පහසුකම් නොමැත.ඒ සඳහා ගබඩා කිරීමට කටයුතු කරමින් පවතී
මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය/නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවට අදාලව අතුරු ව්‍යවස්ථා පනවා ඇත.
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කරීමට ඉදිරියේ දී කටයුතු කරමි.

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා : 492
ආයතනයේ නම : කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

කම්ටුව විසින් හඳුනා ගන්නා ලද දුර්වලතා	**දුර්වලතා මග හරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය.**
පළමු කොටස - 91.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය අභිතකර මතයක් නොව තත්ත්වාගණනය කළ මතයක් වන අතර ඒ සඳහා බලපාන කරුණු අවම කර ගැනීමට කටයුතු කර ඇත.
වීටී පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මේ වන විට යාවත්කාලීන කරමින් පවතී.
මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි .	මෙම මෘදුකාංගය තුල මුරපද වෙනස් කිරීමට ක්‍රමවේදයක් නොමැති වීම මත මුරපද තුන්මසකට වරක් වෙනස් කිරීමට නොහැකි විය.
සංයුත සැලැස්මට අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2025 වර්ෂයේ නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහය අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම 2026 වර්ෂයේ පිළියෙල කර ඇත.
සමාලෝචිත වර්ෂයට අදාලව ප්‍රසම්පාදන සැලැස්මක් නියමිත දිනයට අනුමත කර ගෙන නොතිබුණි.	2024 වර්ෂයේ සිට ප්‍රසම්පාදන සැලැස්ම නියමිත දිනට අනුමත කර ගෙන ඇත.
සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	සියළු වත්කම්වල භෞතික ආරක්ෂාව තහවුරු කර ඇති අතර සභාව විසින් බුක්ති විඳින රජය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ද විධිමත් පරිදි පවරා ගැනීම සඳහා වන ඉල්ලීම් අදාල ආයතන වෙත යොමු කර ඇත.
දෙවැනි කොටස -92.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	වෙබ් අඩවියක් දැනට සභාව සතුව නොවන අතර ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය කටයුතු සැලසීමට බලාපොරොත්තු වේ.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	වෙබ් අඩවියක් දැනට සභාව සතුව නොවන අතර ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය කටයුතු සැලසීමට බලාපොරොත්තු වේ.
වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි.	2026 වර්ෂයේ සිට කසල බදු අය කිරීම සිදු කෙරේ.
මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය/ නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	සභාවේ දෛනික කටයුතු පවත්වා ගෙන යාමට අවශ්‍ය වන්නා වූ සම්මත අතුරු ව්‍යවස්ථා සභාව විසින් වැළඳගෙන ඇති අතර ඉදිරියේදී පැන නඟින අවශ්‍යතා මත අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම හෝ සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට කටයුතු කරනු ලැබේ.

ආකෘති (අංක. 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

ආයතනයේ නම : අලවිව ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගන්නා ලද දුර්වලතා	**දුර්වලතා මඟ හරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය**
පළමු කොටස - 92.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මට්ටමේ/ ව්‍යාචන මට්ටමේ/අභිතකර මට්ටමේ වීම.	විගණනය විසින් හඳුනා ගෙන පෙන්වා දී ඇති අඩුපාඩු මත 2023 වර්ෂයට වාර්ෂික ගිණුම් සම්බන්ධ තත්වාංගනය කල මතය ලැබී ඇත.
ගල් බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණි.	2024 වසරේ සිට නිවැරදිව විධමත්ව ගල් බොරළු ලේඛණය පවත්වා ගෙන යනු ලැබේ.
මෘදුකාංගයට අදාල මුර පද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි.	විගණනය විසින් ලබා දී ඇති උපදෙස් පරිදි මේ වන විට මාස 3කට වරක් මුදුකාංගයට අදාල මුර පද වෙනස් කිරීමට කටයුතු කර ඇත.
ප්‍රධාන සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	මේ වන විට අදාල වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම සකස් කර ඇති බව සඳහන් කරමි.
ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවරීමක් සිදු කර නොතිබුණි.	සියලුම ව්‍යාපාර බලපත්‍ර ලබා ගත හැකි ස්ථාන සඳහා බලපත්‍ර ලබා දීම සිදුකරන බැවිනුත් සෞඛ්‍ය වෛද්‍ය නිර්දේශ නොලැබූ ව්‍යාපාර සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක ආහාර පනත යටතේ නඩු පැවරීමට කටයුතු කරන බවත් අනෙක් ව්‍යාපාර සඳහාද නඩු පැවරීමේ කටයුතු සිදු කිරීමට අදාල කටයුතු සිදු කරනු ලැබේ.
දෙවන කොටස : 92.00	
හඳුනාගත් තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහ ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර තිබුණද ඒවා නිවැරදි නොවන බව විගණනය විසින් පෙන්වා දුන් අතර ලබා දුන් උපදෙස් පරිදි නිවැරදි ජයග්‍රහණ දර්ශක මේ වන විට නියම කර ඇත.

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

ආයතනයේ නම : ඉඹ්බාගමුව ප්‍රාදේශීය සභාව

වාර්තාව මඟින් පෙන්වා දී ඇති අඩුපාඩුව	**ආයතනය විසින් ඒ සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග හා වර්තමාන තත්ත්වය**
පළමු කොටස 90.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ /අභිතකර මට්ටමේ විය.	2023 වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්වාගණනය කළ මතය ලැබී ඇත.
ණයගැති ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මේ වන විට ණයගැති ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලැබේ.
භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි	මේ වන විට අදාල වර්ෂයට නියමිත භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත යොමු කර ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	මේ වන විට අදාල වර්ෂයට නියමිත භාණ්ඩ සමීක්ෂණ තිරණ ක්‍රියාත්මක කර, වාර්තා වාර්තා විගණකාධිපති වෙත යොමු කර ඇත.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරිමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි.
වර්ෂයට අදාලව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය	පහත පරිදි ආදායම් රැස්කර ගැනීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. 1.පොළවල් ටෙන්ඩර් ලබා නොදී සභාව මඟින් පොළ කාසි එකතු කිරීම් කටයුතු සිදු කරන බව 2.හිඟ ආදායම්වලට ජංගම සේවා වැඩසටහන් මඟින් ආදායම් එකතු කිරීම හා දේපල තහනම් කිරීමට කටයුතු සිදු කරන බව 3. කඩ කාමර සම්බන්ධයෙන් නව තක්සේරුවක් සිදු කර ඇති අතර, එම වාර්තාව තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලද පසු ඉදිරි කටයුතු සිදු කරන බව
දෙවැනි කොටස : 94.00	
2018 ජනවාරි 24 වන දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2024 වර්ෂයට අදාලව මානව සම්පත් සැලැස්මක් සකස් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.
සියළු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	2024,2025 වර්ෂය සඳහා අදාල නිලධාරීන්ගෙන් වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාල නිලධාරීන් පිළිබඳ ආයතන ප්‍රධානියා විසින් උචිත බලධාරියා දැනුවත් කර නොතිබුණි.	මේ වන විට අදාල නිලධාරීන් දැනුවත් කර, වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

ආකෘති (අංක.01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ආයතනයේ නම : මහව ප්‍රාදේශීය සභාව

කම්ටුව හඳුනාගත් අඩුපාඩු	**ආයතනය විසින් අදාළ අඩුපාඩු නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ගය/ වර්තමාන තත්ත්වය**
පළමු කොටස: 90.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යවචන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	මහව ප්‍රාදේශීය සභාවේ 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වූ විගණන මතය තත්ත්වාගණනය කළ මතයකි. ඒ අනුව, තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම වූ කරුණු හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023.12.31 දිනට මහව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිවයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන මඟින් පෙන්වා දී තිබේ.
සියලු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	QGIS තාක්ෂණය හරහා සියලු වත්කම් වල තොරතුරු ලබා ගනිමින් පවතින අතර සභාව සතු මූල්‍ය ප්‍රතිපාදන වල ප්‍රමාණවත් බව මත අදාළ සියලු වත්කම් වල ආරක්ෂාව වෙනුවෙන් අවශ්‍ය ආරක්ෂිත වැටවල් ඉදිකිරීමට කටයුතු කර ඇත.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	විමර්ශන සිදු කිරීමට නිර්දේශිත ඌනතා හැර අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කර ඇති අතර විමර්ශන සඳහා නිර්දේශ වූ ඌනතා සම්බන්ධයෙන් විමර්ශන සිදු කර අදාළ විමර්ශන නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවති.
බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.
වර්ෂයට අදාලව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	ආදායම් රැස් කිරීමට අදාළ විශේෂ ආදායම් රැස්කිරීමේ වැඩසටහන් ද සංවිධානය කර ක්‍රියාත්මක කරන අතර මාර්ගගත ක්‍රමයට ද ගෙවීම් කිරීමේ අවස්ථාව ජනතාවට පහසුකම් ලබා දී තිබෙන අතර එමඟින් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය ඉහත නංවා ගැනීමට කටයුතු කර ඇත.

දෙවැනි කොටස: 94.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි	වර්තමානය වනවිට ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන යනු ලැබේ.
සැළසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2023 වර්ෂයේ සැලසුම්ගත පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වුවත් සැලසුම්ගත සැලැස්මට ඇතුළත් නොවන පුහුණු වැඩසටහන් කිහිපයක් පවත්වා ඇති අතර වර්තමානය වන විට සැළැසුම්ගත පුහුණු වැඩසටහන් නියමිත පරිදි පවත්වනු ලැබේ.
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාළ නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	සියලු නිලධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගෙන තිබේ.

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රශ්ණ අංකය - 492

පළාත් පාලන ආයතනය - නිකවැරටිය ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග**
පළමු කොටස - 90.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ව්‍යවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය	2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපති විසින් තත්ත්වාගනනය කළ මතයක් ප්‍රකාශ කර ඇත.
සියලු වත්කම් වලආරක්ෂාව තහවුරු කර නොතිබුණි.	සියලු වත්කම් වල ආරක්ෂාව තහවුරු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ,ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	මෙම අඩුපාඩුව සිදු වී ඇති බව පිළිගනිමි.අදාල නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත.
බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනයට පිළියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට එම ගැටලුව නිවැරදි කර නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ විගණනය වෙත යොමු කර ඇත.
වර්ෂයට අදාළව බිල්කළ ආදායමින් අය කිරීම් පහල මට්ටමක විය.	ආදායම් අය කිරීම යම් ප්‍රමාණයක පහල මට්ටමක පැවති බව පිළිගන්නා අතර, ඉදිරියේ දී ආදායම් අයකිරීම් ඉහල මට්ටමකට රැගෙන යාමට කටයුතු කරමි.
දෙවන කොටස - 94.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මහජනතාව වෙත ආයතනය පිළිබඳ තොරතුරු ලබා දීමට සමාජ මාධ්‍ය ජාලය භාවිතා කරන අතර වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට කටයුතු සලසා ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී ඇති පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	2023 වර්ෂයේ පුහුණු අවස්ථා ලබා දීම අඩු මට්ටමක පැවති බව පිළිගනිමි. එම අඩුපාඩුව මග හරවා ගනිමින් මේ වන විට සමස්ථ කාර්ය මණ්ඩලය වෙත පුහුණු වැඩසටහන් ලබා දී ඇත.
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.
වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිපත් නොකළ ආදාළ නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධාරියා දැනුවත් කර නොතිබුණි.	එම අඩුපාඩුව සිදු වී ඇත. මේ වන විට නිවැරදි කර ඇත.

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා : 492
ආයතනයේ නම : රිදීගම ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගන්නා ලද දුර්වලතා	**දුර්වලතා මඟ හරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය**
පළමු කොටස -96.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය.	විගණකාධිපතිගේ තත්වාගණනය කළ මතය NWLG/KR/A/RPS/05/23/21 හා 2024.05.05 දින ලබා දී ඇත.
ගල් බොරුළු ලේඛනය	ගල් බොරළු ලේඛනයක් සකස් කර යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා මගේ අංක RID/PS/01/23/12/2026 හා 2026.05.19 දිනැති ලිපිය මගින් විෂයය නිලධාරී දැනුවත් කර ඇති අතර ලේඛනය සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.
දෙවන කොටස -91.00	
ආයතනය පිළිබඳ මහජනතාවට තොරතරු ලබා දීමට වෙබ් අඩවියක් නිර්මානය කිරීම	මහජනතාවට තොරතරු ලබා දීමට www.rideegamaps.lk නමින් වෙබ් අඩවියක් ආරම්භ කිරීමේ මූලික කටයුතු සිදු කර ඇති අතර එමඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා ඉදිරිපත් කිරීමට අවස්ථාව උදා කර දීමට නියමිතය.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරිමට අවස්ථාව සලසා දී නොතිබිණි.	
ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමේ වැඩපිලිවෙල	ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කර ගබඩාකර තබා ගැනීමට අවශ්‍ය පහසුකම් අප සභාව තුල නොමැති අතර එය විධිමත් පරිදි අලෙවි කිරීමටත්, විනාශ කිරීමටත් නොහැකි තත්ත්වයක් මතු වී ඇත. මේ සම්බන්ධව පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් නිශ්චිත වැඩපිළිවෙලක් සිදුකර දැනුවත් කිරීමෙන් අනතුරුව ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩපිළිවෙල සැකසීමට නියමිතය.
වරිපනම් කලාපයේ ව්‍යාපාරික ස්ථානවලින් රැස් කරන අපද්‍රව්‍ය සඳහා ගාස්තු අය කිරීම	රිදීගම ප්‍රදේශීය සභාබල ප්‍රදේශයේ වරිපනම් බදු අය කරන කලාප වල ව්‍යාපාරික ස්ථාන සීමා සහිත ප්‍රමාණයක් ඇති අතර ඔවුන්ට අවශ්‍ය මූලික පහසුකමක් වශයෙන් කසල එකතුකිරීමේ කටයුතු සිදු කරන අතර මෙතෙක් ඒ සඳහා බදු අය කිරීමක් නොකල අතර ඉදිරියේ දී ඒ සඳහා අවධානය යොමු කර ඇත.
අතුරු ව්‍යවස්ථා පැනවීම	ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු කාරණා 30 ක් පෙන්වා දී ඇති අතර, එයින් පෙන්වා දී ඇති කරුණු 13 ට අදාළව මේ වන විට සභාව මඟින් වැලදගෙන තිබෙන සම්මත අතුරු ව්‍යවස්ථා තුළ ඇතුලත් වී ඇති බවත් සභාවේ අවශ්‍යතාවය මත ඉදිරියේ දී අනිකුත් කාරණා සඳහා ද අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට නියමිතය.

ආකෘති පත්‍ර 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා : 492

ආයතනයේ නම : වාරියපොල ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගන්නා ලද දුර්වලතා	**දුර්වලතා මඟ හරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය**
පළමු කොටස -92.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාචන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	තත්වාගණනය කළ මතයක් ලැබී ඇත.
වීථි පහන් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි	වීථි පහන් ලේඛනය යාවත්කාලීන කරමින් පවතී
සියළු වත්කම්වල ආරක්ෂාව තහවුරුකර නොතිබුණි	ඉඩම් සඳහා වැට මායිම් යෙදීමට සභාවට විශාල පිරිවැයක් දැරීමට සිදුවන බැවින් අදියර වශයෙන් වැට මායිම් යෙදීම සිදුකරන බව
වර්ෂයට අදාලව බිල්කල ආදායමෙන් අයකිරීම පහල මට්ටමකවීම	ජංගම වැඩසටහන්, රතු නිවේදන, වරෙන්තු නිකුත් කිරීම්, දේපල තහනම් කිරීම් මඟින් හිඟ ආදායම් සහ වර්ෂයේ බිල්කල ආදායම් අයකර ගැනීමට කටයුතු යොදා ඇත.
දෙවන කොටස : 95.00	
හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි	හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර ඇත.
සියළුම නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත්කර නොතිබුණි	සභිකවරුන්ගෙන් හැර ආයතනයේ අනෙකුත් කාර්යමණ්ඩලයෙන් වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගෙන ඇත.
වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකල අදාළ නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත්කර නොතිබුණි.	වාර්ෂිකව වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දිය යුතුව පැවතියේ සභිකවරුන් පමණක්වන අතර එම අයගේ සභාකාලය 2023 මාර්තු මාසයෙන් අවසන් වීමට නියමිතව තිබූ බැවින් එය දැනුවත් කිරීම සිදු නොකල බව .

ආකෘතිය (අංක 01)

පාර්ලිමේන්තු සැසි අංක : 492
ආයතනයේ නම : බිංගිරිය ප්‍රාදේශීය සභාව

කමිටුව හඳුනාගත් අඩුපාඩු	**ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය**
පළමු කොටස : 95.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ /අභිතකර මට්ටමේ විය.	2023 වර්ෂයට අදාලව මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්වාගණනය කළ මතය ලැබී ඇත.
වීථි පහන් ලේඛනය යාවත් කාලීනව පවත්වා නොතිබීම	වීථි පහන් ලේඛනය යාවත් කාලීන කරමින් පවතී.
සියලු වාහන වල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොතිබීම	ලියාපදිංචි සහතික නොමැති වාහන වල අයිතිය තහවුරු කර ගැනීමට අවශ්‍ය ලියාපදිංචි සහතික ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.
දෙවන කොටස : 93.00	
වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වා ගෙන ගොස් නොතිබීම.	වෙබ් අඩවියක් නිර්මාණය කර ගැනීමට මූලික පියවර ගනිමින් පවතී.
පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබීම.	බල ප්‍රදේශය තුල ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම,වාර්ෂික සමීක්ෂණ වැනි වැඩසටහන් තුළින් තවදුරටත් පරිසර බලපත්‍ර ලබාදිය යුතු ආයතන හඳුනාගැනීමට කටයුතු කරයි. ඒ අනුව මේ වන විට පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලු ආයතන සඳහා පරිසර බලපත්‍ර ලබාදීමට කටයුතු කරමින් පවතී.
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබීම.	සියලු නිලධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීමට කටයුතු කර ඇත.
වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාළ නිලධාරීන් පිළිබඳව ආයතනන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබීම.	

ආකෘති (අංක. 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක **:- 492**

ආයතනයේ නම **:- ගිරිබාව ප්‍රාදේශීය සභාව**

කණ්ඩායම් විසින් හඳුනාගත් අඩුපාඩුව	**ක්‍රියාමාර්ගය**
පළමු කොටස : 96.00	
ගිණුම් පිළිබඳව විගණනය විසින් යටත්ව මතයක් ප්‍රකාශ කිරීම	හොඳ මතයක් ලබා ගැනීම සඳහා අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි.
අපහරණය නොකළ මාස 08 කට වැඩි ගර්හිත වාහන	අපහරණය කිරීමට පැවති කහ යකඩ ජල බවුසරය 2026.05.08 වන දින ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සිදු කරන ලදි.
දෙවැනි කොටස : 92.00	
වෙබ් අඩවියක් පවතවාගෙන ගොස් නොතිබීම	වෙබ් අඩවියක් නිර්මාණය කර ඇතත් තාක්ෂණික ගැටලු හේතුවෙන් වෙබ් අඩවිය ක්‍රියාත්මක තත්වයේ නොපවතී.
කසල කළමනාකරණය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබීම.	කසල කළමනාකරණය කිරීම සඳහා 2026 වර්ෂයේ විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ඇත.
වරිපනම් කලාපය තුළ ව්‍යාපාරික ස්ථානවලින් ගාස්තු අය කර නොගැනීම.	බල ප්‍රදේශය තුළ මේ වන තෙක් වරිපනම් කලාපයක් ස්ථාපිත කර නොමැති බවත් ඉදිරියේදී දියුණු ප්‍රදේශයක් තෝරා ගෙන වරිපනම් කලාපයක් ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත.
ලබා දී ඇති පුහුණු අවස්ථා ප්‍රමාණය 50% කට වඩා අඩු වීම	අත්‍යවශ්‍ය පුහුණු වැඩසටහන් සඳහා පමණක් කාර්ය මණ්ඩලය යොමු කරමි.
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	සියලු නිලධාරීන්ගෙන් වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගෙන ඇත.
වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාළ නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	

ආකෘතිය (අංක 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492
ආයතනයේ නම :කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගන්නා ලද දුර්වලතා	**දුර්වලතා මඟ හරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය**
පළමු කොටස : 97.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	2021 වර්ෂයේ සිට පැවත එන ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂයන්වල මූල්‍ය ප්‍රකාශන ශේෂයන් හා උප ලේඛන ශේෂයන් අතර වෙනසක් පවතී. එබැවින් මෙම තත්ත්වය ඇති වූ අතර, 2027 වර්ෂයේදී එම ශේෂයන් නිරවුල් කිරීමටත්, විගණන මතය හිතකර මට්ටමේ පවත්වා ගැනීමටත් කටයුතු කරනු ලැබේ.
දෙවැනි කොටස : 91.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	මේ වන විට www.kobeiganeps.lk යන වෙබ් ලිපිනය යටතේ වෙබ් අඩවිය සකස් කරමින් පවතී.
මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය/ නගර සභා ආඥා පනතේ 157 වගන්තිය / ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා සැකසිය යුතු කරුණු අතරින් 126(ix) ඒ උපවගන්තිය යටතේ වූ කුකුල්කොටු පවත්වාගෙන යාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව කෙටුම්පත් කර අනුමැතිය සඳහා 2024.04.10 දිනැතිව වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. තවද අමතර කරුණු 05 ක් සම්බන්ධව අතුරු ව්‍යවස්ථා 05 ක් කෙටුම්පත් කර පරීක්ෂාවට හා නිර්දේශයට මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත ඉදිරිපත් කර ඇත. නිර්දේශය ලද පසුව අනුමැතියට ඉදිරිපත් කරනු ලැබේ.
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි	අනියම් සේවක පදනමින් සේවය කළ පෙර පාසල් සහාය පාලිකා තනතුර දරණ එක් අයෙක්, රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 25/2014 අනුව අනුමත තනතුරු ප්‍රමාණය නොසලකා දින 180 ක අඛණ්ඩ සේවා කාලය පදනම් කර ගනිමින් ස්ථිර පත්වීම් ලබාදීමට සිදු වීම නිසා මෙම තත්ත්වය ඇති වී ඇත. 2019.03.21 දිනැති කොබෙයිගනේ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ අංක කො/ප්‍රා/ස/1/12/05/II ලිපිය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතියට ඉදිරිපත් කර ඇත.

	තවද මේ සම්බන්ධව වයඹ පළාත් පාලන කොමසාරස්ගේ අංක ව/පපාදෙ/01/08/01/38 හා 2024.07.19 දිනැති ලිපිය මඟින් මෙවැනි තනතුරු සම්බන්ධ තොරතුරු විමසා සිටි අතර, එ මඟින් වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙතද දන්වා ඇත.

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

පළාත් පාලන ආයතනය : පන්නල ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගන්නා ලද දුර්වලතා	**දුර්වලතා මඟ හරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය**
පළමු කොටස -95.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය.	හිතකර මතයක් බවට පත් කර ගැනීමට කටයුතු කරමින් සිටින බව කාරුණිකව දන්වා සිටිමි.
බැංකු සැසඳුම් වලින් අණවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	බැංකු සැසඳුම් වලින් අනාවරණය වූ ගැලපුම් නිරවුල් කිරීමට කටයුතු කර ඇත.
දෙවන කොටස : 93.00	
අනුමත සීමාව ඉක්මවා කාර්යමණ්ඩලය බඳවාගෙන තිබුණි	අත්‍යාවශ්‍ය සේවා සඳහා කාර්යමණ්ඩලය බඳවාගෙන ඇති අතර කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

ආකෘති (අංක. 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක :- 492

ආයතනයේ නම :- මාවතගම ප්‍රාදේශීය සභාව

කණ්ඩායම් විසින් හඳුනාගත් අඩුපාඩුව	**ක්‍රියාමාර්ගය**
පළමු කොටස : 94.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය.	තත්වාගණනය කළ මතය ලැබී ඇත.
වර්ෂයට අදාව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	ආදායම් පරීක්ෂක මහතෙකු නොමැති වීමෙන් බදු අය කර ගැනීම පහළ මට්ටමක පැවති අතර මේ වන විට වැඩ බලන ආදායම් පරීක්ෂක මහතුන් දෙදෙනෙකු ලවා නිහ අය කර ගැනීමට කටයුතු කරමින් පවති.
නිහ වරිපනම් අයකර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් කර නොතිබුණි.	වරෙන්තු නිකුත් කර දේපල තහනමක්ද සිදු කර ඇත. දඩ බිල්කිරීමක් සිදු කර නැත. 2024 වර්ෂයේදී දඩ බිල්කිරීම සිදු කර ඇත.
දෙවැනි කොටස : 96.00	
ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය වෙනම රැස්කිරීමට වැඩ පිළිවෙළක් නොතිබුණි.	දෛනික කසල එකතු කිරීමේ ක්‍රියාවලියේදී අවිධිමත් කසල සමග මිශ්‍ර වී ඇති ඉලෙක්ට්‍රෝනික අපද්‍රව්‍ය තෝරා වෙන්කර ඝණ අපද්‍රව්‍ය මධයස්ථානය තුළ වෙනම එක්රැස්කර ඇත. මධ්‍යම පරිසර අධිකාරීය මඟින් නිවේදනය කරනු ලබන විශේෂ වැඩසටහන්වලදී ජනතාව දැනුවත් කර ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය එක්රැස්කර මධ්‍යම පරිසර අධිකාරිය වෙත බාරදීම සිදුකරනු ලබයි. මධ්‍යම පරිසර අධිකාරීය මගින්ද එකතු නොකරන ඉවත් කරන ලද විදුලි බල්බ ප්‍රාදේශීය සභාව තුළ එක්රැස්ව ඇත.
මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය/නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තියඅනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරනු ලැබේ.

ආකෘතිය (අංක 01)

පාර්ලිමේන්තු මාලාවේ අංකය - 492

ආයතනයේ නම - පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව

වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/ වත්මන් ත්ත්වය
පළමු කොටස 95.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය	තත්ත්වාගණනය කළ මතය ලැබී ඇත.
මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස්කර නොතිබුණි.	මේ වන විට මෘදුකාංගයට අදාල මුරපදය වෙනස් කර ඇත.
හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් කර නොතිබුණි.	2022 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ පඬුවස්නුවර ප්‍රාදේශීය සභාවේ හිඟ වරිපනම් ශේෂයක් නොමැත.
දෙවැනි කොටස 95.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	අද වන විට පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව පිළිබඳව සියලු තොරතුරු ඇතුළත් වෙබ් අඩවියක් පවත්වාගෙන යනු ලැබේ.
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාළ නිලධාරීන් පිළිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	මේවන විට වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත්කර ඇත.

ආකෘති පත්‍ර අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ආයතනයේ නම : උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගන්නා ලද දුර්වලතා	**දුර්වලතා මඟ හරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය**
පළමු කොටස - 93.00	
ආයතනයේ ගිණුම් පිලිබඳව විගණන මතය	සත්‍ය හා සාධාරණ තත්වයක් පිලිබිඹු කරන මතයකි
බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිළියල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි	බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට පිලියෙල කර සහතික කර විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.
වර්ෂයට අදාලව බිල් කල ආදායමෙන් අයකිරීම පහල මට්ටමක විය.	වර්ෂයට අදාල බිල් කල ආදායමෙන් අයකිරීම් මේ වන විට සැලකිය යුතු ප්‍රමාණයක් වැඩි කරගෙන ඇත.
දෙවන කොටස - 97.00	
සියලුම නිළධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකල අදාල නි ළධාරීන් පිලිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	සියලු නිළධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගෙන ඇත.
වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකල අදාල නිළධාරීන් පිලිබඳව ආයතන ප්‍රධානියා විසින් උචිත බලධරයා දැනුවත් කර නොතිබුණි.	

ආකෘති (අංක 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ආයතනයේ නම : ගල්ගමුව ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගන්නා ලද දුර්වලතා	**දුර්වලතා මඟ හරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය**
පළමු කොටස :94.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත් මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	තත්වාගණනය කරන ලද විගණන මතය ලැබී ඇත.
මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	payroll මෘදුකාංගයට අදාළ මුර පද වෙනස් කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය විමසා උපදෙස් ලබාගැනීමට කටයුතු කරමි.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර හතරක්වත් පවත්වා නොතිබුණි.	2024 වර්ෂයේ පටන් විගණන හා කළමනාකරණ කමිටු වසරකට හතර බැගින් පවත්වා ඇත.
පළමු කොටස :97.00	
සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාළ නිලධාරීන් පිළිබඳ ආයතන ප්‍රධානියා විසින් ලිඛිත ප්‍රකාශ ඉදිපත් කර නොතිබුණි	සභාවේ ලේකම්තුමාගේ වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

ආකෘති (අංක 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ආයතනයේ නම : පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**ආයතනය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග/අඩුපාඩු/වත්මන් තත්වය නිවැරදි කිරීම**
පළමු කොටස - 95.00	
ආයතනයේ ගිණුම පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අභිතකර මට්ටමේ විය.	2023/12/31 න් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය සඳහා යටත්ව මට්ටමේ විගණන මතයක් ලැබී ඇත.අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.
ප්‍රධාන සංයුක්ත සැලැස්ම පිළියෙළ කර නොතිබුණි	ප්‍රධාන සංයුක්ත සැලැස්ම පිළියෙළ කර තිබුණි
ආයතනය තුළ පවත්වනු ලබන විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට 1 බැගින් රැස්වීම් 4 ක් නොපැවැත්වීම.	2024 වර්ෂයේ සිට කාර්තුවකට 1 බැගින් රැස්වීම් 4 ක් පැවැත්වීමට කටයුතු කර ඇත.
දෙවන කොටස - 98.00	
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීමට අවස්ථාව සලසා දී නොතිබිණි.	මුහුණු පොත හරහා මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීමට අවස්ථාව සලසා දී ඇත.

ආකෘති (අංක 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා : 492

ආයතනයේ නම : නාරම්මල ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගන්නා ලද දුර්වලතාවය	**දුර්වලතා මඟහරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්වය**
පළමු කොටස-97.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් අඩුපාඩු නිවැරදි කිරීමෙන් පසු 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනය සඳහා තත්වාගණනය කල මතයක් ලබාගැනීමට හැකිවිය.

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ආයතනයේ නම : කුරුණෑගල ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගන්නා ලද දුර්වලතා	**දුර්වලතා මඟ හරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය**
පළමු කොටස :97.00	
ආයතනය පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය. -	ආයතනයේ විගණන මතය ප්‍රශස්ථ මට්ටමට ළඟාකරගැනීම සඳහා වන කාර්යයන් දැඩි අවධානයෙන් යුතුව ක්‍රියාත්මක කරමි.

ආකෘති (අංක 01)

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : 492

ආයතනයේ නම : පුත්තලම මහ නගර සභාව

කම්ටුව විසින් හඳුනාගන්නා ලද දුර්වලතා	**දුර්වලතා මඟ හරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය**
පළමු කොටස 64.00	
සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පෙබරවාරි 28 දිනයට පෙර ඉදිරිපත් කර නොතිබුණි.	2022.09.06 දිනැති අංක 2296/05 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පුත්තලම නගර සභාව මහ නගර සභාවක් බවට සංස්ථාපනය කර ඇත. පුත්තලම මහා නගර සභාවේ මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට නාගරික කොමසාරිස් ඇතුළු අවශ්‍ය වන්නා වූ යටිතල පහසුකම් රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් සම්පාදනය කළ යුතු වුව ද, එසේ සම්පාදනය නොකිරීම හේතුවෙන් නගර සභා ගිණුම පමණක් ඉදිරිපත් කොට ඇත.
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත් මට්ටමේ / ව්‍යාරණ මට්ටමේ අභිතකර මට්ටමේ විය.	ඒ අනුව, විගණනය විසින් මහ නගර සභා ගිණුම ඉදිරිපත් කොට නොමැති බවට දන්වමින් අභිතකර මතයක් ප්‍රකාශයට පත්කොට ඇත.
ණයගැති ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ණයගැති ලේඛනය EMETSOFT පරිගණක ගිණුම් ක්‍රමය ඔස්සේ යාවත්කාලීන කොට තිබේ.
ණයහිමි ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ණයහිමි ලේඛනය EMETSOFT පරිගණක ගිණුම් ක්‍රමය ඔස්සේ යාවත්කාලීන කොට තිබේ.
ඉඩම් කට්ටි කර විකිණීමේ බදු ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ඉඩම් කට්ටි කර විකිණීමේ බදු ලේඛනය මේ වනවිට යාවත්කාලීන කරමින් පවතී.
ඇස්තමේන්තු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	ඇස්තමේන්තු ලෙජරය පවත්වාගෙන ගොස් ඇත. පුත්තලම නගර සභාවට අවශ්‍ය වන්නා වූ තාක්ෂණික නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන්ගේ දීර්ඝ කාලයක පටන් පවතින පුරප්පාඩු හේතුවෙන් දෛනික කාර්යාල කටයුතු පවත්වාගෙන යාම සිදු කරනු ලබන්නේ වැඩකම්කරුවන් සෞඛ්‍ය කම්කරුවන් සහ කාර්යාල කාර්යය සහායකයින් විසිනි. ඒ අනුව, මෙකී ලේඛන පවත්වා ගැනීමේ දුෂ්කරතාවයක් පැවතියද මෙම ලෙජරය වර්තමානයේ දී යාවත්කාලීන කරමින් තිබේ.

විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම පිළිතුරු සපයා නොතිබුණි.	2023 වර්ෂයට අදාළ සියලුම විගණන විමසුම් සඳහා මේ වන විට පිළිතුරු සපයා ඇත.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4ක් පවත්වා නොතිබුණි.	2023 වර්ෂයට අදාළව විගණන කළමනාකරන කමිටු රැස්වීම් වාර දෙකක් පවත්වා ඇති අතර මේ වන විට නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇත.
භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂයේදී භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර ඇති අතර, ඉදිරියේදී විගණකාධිපති වෙත එකී තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
වාහනයක් ගර්හිත වී මාස 6 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි.	ගර්හිත වූ වාහන අපහරණය කිරීමේ කාර්යය දීර්ඝ කාලීන කටයුත්තක් වන අතර, 2026 වර්ෂයේදී එම අපහරණ කටයුතු සම්පූර්ණ කොට ඇත.
ජංගම ගිණුමේ අතිරික්ත මුදල් කාලීන තැන්පතුවල සුදුසු පරිදි ආයෝජනය කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර නොතිබුණි.	පළාත් පාලන ආයතනයක පොදු අරමුදල අදාළ පනතට අනුව බල ප්‍රදේශයේ ජනතාවගෙන් අය කරගන්නා බදු මුදලින් සහ ගාස්තුවලින් සමන්විත වේ. වාර්ෂික අයවැය මගින් ලැබෙන ආදායමට සමාන වියදම් ඇස්තමේන්තුවක් ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය, මහා මාර්ග සහ යටිතල පහසුකම් කටයුතු සඳහා වියදම් කරනු ලබන අතර, පළාත් පාලන ආයතනයක් මගින් ඊට අනුගත නොවී මුදල් අතිරික්ත කොට, කාලීන තැන්පතුවල සුදුසු පරිදි ආයෝජනය කිරීම සඳහා නීතිමය ප්‍රතිපාදන නොමැති හෙයින්, මහජනතාවගේ ඉල්ලීම් අනුව ඔවුන්ගේ පොදු පහසුකම් සලසා දීම සඳහා අදාල මුදල් වැය කිරීම සිදු කරනු ලබයි.
වර්ෂයට අදාළව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	පුත්තලම නගර සභාවේ ආදායම් අංශයේ ආදායම් එකතු කිරීමේ කාර්යයේ යොදවනු ලබන්නේ සෞඛ්‍ය කම්කරුවන් සහ වැඩ කම්කරුවන් වේ. තව ද ආදායම් පරීක්ෂක තනතුරු හතරක් අනුමත වී තිබුණ ද, එහි හිහතාවය හේතුවෙන් ආදායම් එකතු කිරීමේ ගැටලු සහගත තත්ත්වයක් පවතී. එහෙත් ජංගම වැඩසටහන් පැවැත්වීම තුළින් මෙකී හිඟ ආදායම් එකතු කිරීම සිදු කරනු ලබයි.

වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලු දේපළ සඳහා අයවිය යුතු සියලු බදු මුදල් පූර්ණ ලෙස අයකර නොතිබුණි.	අදාල වර්ෂයන්හි හිඟ ටෙන්ඩර් මුදල් පවතින ව්‍යාපාර අසාධු ලේඛනගත කර ඇති අතර, ඒවාට එරෙහිව නීතිමය පියවර ද ගනිමින් පවතී.
ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවරීමක් සිදු කර නොතිබුණි.	මේ වනවිට අදාළ සමීක්ෂණ කටයුතු සිදුකරමින් බල ප්‍රදේශයේ සියලුම ව්‍යාපාර හා වෙළඳ ආයතන හඳුනාගෙන බලපත්‍ර ලබාදීමේ කාර්ය සිදුකරගෙන යන අතර, හිඟ මුදල් අය කර ගැනීම සඳහා ද අදාළ නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් පවතී.
දෙවන කොටස 71.00	
පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	මේ වනවිට පරිසර බලපත්‍ර ලබා ගත යුතු ආයතන හඳුනාගෙන පරිසර බලපත්‍ර නිකුත් කරමින් පවතී.
මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය / නගර සභා ආඥා පනතේ 157 වගන්තිය / ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	පුත්තලම නගර සභාව විසින් 2009.12.23 දිනැති අංක 1634 දරන ගැසට් පත්‍රය මගින් සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගෙන තිබේ. තව ද, පුත්තලම මහා නගර සභාව විසින් 2025.06.13 දිනැති අංක 2441 දරන ගැසට් පත්‍රය මගින් සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඇත.
පළාත් පාලන ආයතන විසින් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොමැත්තේ නම් ආදර්ශ අතුරු ව්‍යවස්ථා තමන් විසින් සභා සම්මතයක් මගින් පිළිගෙන, ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර එය බලාත්මක කර නොතිබුණි.	පුත්තලම නගර සභාව විසින් 2009.12.23 දිනැති අංක 1634 දරන ගැසට් පත්‍රය මගින් සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගෙන තිබේ. තව ද, පුත්තලම මහා නගර සභාව විසින් 2025.06.13 දිනැති අංක 2441 දරන ගැසට් පත්‍රය මගින් සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඇත.
අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබුණි.	මහජනතාවට අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා පුත්තලම මහජන පුස්තකාලයේ සහ කාර්යාල පරිශ්‍රය තුළ, පුත්තලම නගර සභාව සහ පුත්තලම මහා නගර සභාව විසින් වැළඳ ගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථා ප්‍රදර්ශනය කොට ඇත.
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	පුත්තලම නගර සභාව, මහා නගර සභාවක් බවට උත්ශ්‍රේණිගත වීමත් හා සමග මහා නගර සභාවට අවශ්‍ය සේවක සංඛ්‍යාව අනුමැතියට ඉදිරිපත් කොට ඇති අතර, එම සේවක සංඛ්‍යාව අනුමත වූ පසුව 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි මානව සම්පත් සැලැස්මක් සෑදීමට කටයුතු කරනු ලැබේ.
සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් 50% කට වැඩි පිරිසකට	පුත්තලම මහා නගර සභාවේ (එවකට පුත්තලම නගර සභාව) සංවර්ධන නිලධාරී සහ කළමනාකරණ සේවා නිලධාරී තනතුරුවල පවතින පුරප්පාඩුවල

වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	කටයුතු කරනු ලබන්නේ කාර්යාල කාර්ය සහායකවරුන් සෞඛ්‍ය කම්කරුවන් සහ වැඩ කම්කරුවන් විසින් වන අතර, එකී සේවකයන් ද ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුම සේවකයන් වෙත 50%කට වඩා වැඩි සැලසුම්ගත පුහුණු අවස්ථා ප්‍රමාණයක් ලබාදීමට කටයුතු කරමින් පවතී.
සමස්ත කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබුණි.	මේ වන වනවිට සමස්ත කාර්ය මණ්ඩලයට කාර්ය සාධන ගිවිසුම් සකස් කරමින් පවතී.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	පුත්තලම නගර සභාව, මහා නගර සභාවක් බවට උත්ශ්‍රේණිගත වීමත් සමග මහා නගර සභාවට අවශ්‍ය සේවක සංඛ්‍යාව අනුමැතියට ඉදිරිපත් කොට ඇති අතර, එම සේවක සංඛ්‍යාව අනුමත වූ පසුව මානව සම්පත් සැලැස්මක් සෑදීමට කටයුතු කරනු ලැබේ. එකී මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට පනහකට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය දොළහකට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කිරීමට කටයුතු කරනු ලැබේ.

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 492

ආයතනයේ නම :-හලාවත නගර සභාව

වාර්ථාවේ හඳුනාගත් අඩුපාඩු	**අඩුපාඩුව නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග/වර්තමාන ප්‍රගතිය**
පළමු කොටස :95.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය	තත්ත්වාගණනය කළ මතයකි
වර්ෂයට අදාලව බිල් කළ ආදායමෙන් අයකිරීම පහළ මට්ටමක විය.	සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු හිඟය රු.49071103ක්වේ.2026/01/01 සිට 2026/05/31 දක්වා ප්‍රවර්තන වර්ෂයට අදාළව රු.18462128.32 ක මුදලක් රැස් කොට ඇති අතර ඉතිරි කාර්තු දෙක සඳහා ක්ෂේත්‍ර නිළධාරීන් තිදෙනෙකු යොදවා ජංගම එකතු කිරීමේ වැඩසටහන් පවත්වන අතර එමඟින් වර්ෂයට අදාළ වරිපනම් එකතු කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
දෙවන කොටස : 95.00	
ආයතනය පිළිබඳ මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබිණි.	මේ වන විට වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන යනු ලබයි.මහජනයාට අවශ්‍ය තොරතුරු මේ හරහා ලබා ගත හැක.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථා සලසා දී නොතිබිණි.	මේ වන විට වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථා සලසා දී ඇත.
වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අයකර නොතිබිණි.	නගර සභාව විසින් වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය සඳහා මුදලක් අය නොකරන අතර එය සේවාවක් ලෙස සිදු කරයි.ඉදිරියෙදි මෙම ගාස්තු අය කිරීම සඳහා ක්‍රම වේදයක් ගැසට් කිරීමට බලාපොරොත්තු වේ.

ආකෘති අංක 01

පාරලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492
ආයතනනය : කරුවලගස්වැව ප්‍රාදේශීය සභාව.

පෙන්වා දී ඇති දුර්වලතා	එම දුර්වලතා මගහරවා ගැනීමට ගත් ක්‍රියාමාරග
පළමු කොටස : 73.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය	තත්වාගනනය කල මතයක් ලැබී ඇත.
ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය කොන්ත්‍රාත් ලේඛනය හානි පිළිබඳ ලේඛනය. වීථි පහන් ලේඛනය ඉඩම් කට්ටි කර විකිණීවේ ලේඛනය ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය ගල් හා බොරළු ලේඛනය	යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ
මෘදුකාංගයට අදාලව මුරපද තුන්මසකට වරක් වෙනස්කර නොතිබීම	මුරපද වෙනස් කිරීමට කටයුතු කර ඇත
සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැළැස්ම නියමිත දිනට අනුමත කර නොතිබීම	2026 වන විට ප්‍රසම්පාදන සැළැස්ම මහ සභාවේ අනුමැතියට යොමු කර ක්‍රියාත්මක කරනු ලැබේ.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම වසරකට 4 වතාවක් නොපැවැත්වීම	කාර්තුවට එක බැගින් කමිටු 4ක් පවත්වනු ලැබේ
වත්කම් වල ආරක්ෂාව තහවුරු කර නොතිබීම	වත්කම් වල ආරක්ෂාවට පියවර ගෙන ඇත
භාණ්ඩ සමීක්ෂණ නිර් දේශ ක්‍රියාත්මක කර නොතිබීම	2026 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කර ඇත
සියලු වාහන වල අයිතිය තහවුරු කර නොතිබීම	ප්‍රධාන ලේකම් භාරයේ ඇති 53-6125, 32-2644 සහ LP 3256 අංක දරණ ලොරි රථය පවරා ගැනීමට කටයුතු සිදුකරමින් පවතී
වර්ෂයේ බිල් කල ආදායමෙන් අයකිරීම පහල අගයක් ගැනීම	ආදායම් රැස්කිරීමේ ජංගම වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත
හිඟ වරිපනම් අය කර ගැනීමට වරෙන්තු නිකුත් කර නොතිබීම	හිඟ වරිපනම් අය කිරීමට වරෙන්තු නිකුත්කර නැත
ටෙන්ඩර් දිය යුතු දේපළ බදු දී නොතිබීම	පුවත්පත් දැන්වීම් පල කර දේපළ බදු දීම් සිදු කර ඇත
හිඟ බදු කුලී අය කිරීමට නෛතික ක්‍රියා මාර්ග ගෙන නොතිබීම	නඩු පැවරීම් සිදු කර ඇත. ආරක්ෂිත ඇප මුදලින් කුලී මුදල් හිලව් කර ඇත
දෙවන කොටස : 48.00	
ඉල්ලා සිටිනු ලබන තොරතුර ලබා නොදීම සම්බන්ධව ඉදිරිපත් වන පැමිණිලි ලේඛනගත කිරීම හා ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග පැහැදිලි කරන ලේඛන පවත්වා නොතිබුණි	ලේඛනයක් සකස් කර ඇත.එවැනි පැමිණිලි ලැබී නොතිබුණි
මහජනයා වෙත තොරතුරු ලබා දීමට වෙබ් අඩවියක් සාදා නොතිබීම	වෙබ් අඩවියක් නොතිබුණි.

වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි	වෙබ් අඩවියක් නොතිබුණි
ජාතික ප්‍රතිපත්ති වලට අදාලව කසල කළමනාකරණ සැළැස්මක් නොතිබීම	ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැළැස්මක් සකස්කර මහ සභාවේ අනුමැතිය ලබා ඇත
ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය වෙනම රැස්කිරීමට වැඩ පිළිවෙලක් නොතිබීම	දෛනිකව එක්රැස්වන ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය ගබඩා කර ඇති අතර මධ්‍යම පරිසර අධිකාරිය විසින් සිදුකරන වැඩසටහන් වලදී ජනතාව දැනුවත් කර මධ්‍යම පරිසර අධිකාරිය වෙත යවනු ලැබේ.
ප්ලාස්ටික්, පොලිතීන් ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීමේ වැඩ පිළිවෙලක් නොතිබීම	වර්තමානයේ ක්‍රියාත්මක කෙරේ.
පරිසර බලපත්‍ර ලබා ගත යුතු ආයතන සියල්ල බලපත්‍ර ලබා නොතිබීම	පරිසර බලපත්‍ර ලබා දීය යුතු ආයතන දැනුවත් කර බලපත්‍ර ලබා දීමට කටයුතු කරනු ලැබේ.
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබීම	සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳගෙන ඇත.
ආයතනයේ පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම ඇගයුම් කිරීමට/අධීක්ෂණය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි	පුරවැසි ප්‍රඥප්තියට අනුව කටයුතු සිදු වනවාද යන්න අංශ ප්‍රධානීන් මගින් අධීක්ෂණය කෙරේ.
මානව සම්පත් සංවර්ධන සැළැස්මක් නොතිබීම	මානව සම්පත් සංවර්ධන සැළැස්මක් සකස් කර ඇති අතර ක්‍රියාත්මක කරනු ලැබේ
සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම් තබා නොතිබුණි	කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබේ.
මානව සම්පත් සැළැස්ම සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටද ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් පත් කර නොතිබුණි	රාජකාරි පැවරීම් සිදු කර ඇත
අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබීම	අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු තනතුරු සඳහා සහ සේවා අවශ්‍යතාවය මත අනියම් පදනමින් සේවයේ යෙදවා ගෙන ඇත.
2/2020 මුදල් චක්‍රලේඛය අනුව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්ය භාරය මිණුම් කළ හැකි කාර්ය සාධන දර්ශක 3ක් හඳුනාගත නොහැකි වීම	නිවැරදි කිරීමට කටයුතු කර ඇත

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ආයතනයේ නම : කල්පිටිය ප්‍රාදේශීය සභාව

වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති පියවර/වත්මන් තත්ත්වය
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අභිතකර මට්ටමේ විය.	වර්තමානය වන විට තත්වාගණනය මතය හිමි කරගෙන ඇත.
ද්‍රව්‍ය ආපසු භාරදීමේ ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් පසුව පෙන්වා දුන් අඩුපාඩු හඳුනාගෙන යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ඇත.
මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	අද වන විට මුරපදය වෙනස් කිරීමට කටයුතු කර ඇත.
ප්‍රධාන සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2026 වර්ෂය දක්වා සකස් කර ඇත. (2023 සිට 2026)
සංයුක්ත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කොට සභා සම්මත කර නොතිබුණි.	තීරණ පොතේ සටහන්ව සම්මත කර ඇත. 2026 වර්ෂය සඳහා මහසභා අනුමැතිය ලබාගෙන ඇත.
2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ආංශික ක්‍රියාකාරී සැලසුම් චක්‍ර ලේඛයේ ප්‍රකාරව 2026 වෙනුවෙන් සකසා ඇත.
වර්ෂයට අදාළ බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	හිඟ මුදල් අය කිරීම සඳහා සේවකයින් දෙදෙනෙක් යොමු කර ඇත. වාර්ෂික බිල් කිරීම් R.I මහතුන් මගින් අය කිරීම් සිදු කරනු ඇත. වර්තමාන අය කිරීම් වර්ධනය වීමක් සිදුවෙමින් ඇත.
හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් කර නොතිබුණි.	කේ පෝරම බෙදා දීමේදී සිදුවී ඇති අඩුපාඩු නිසා වරෙන්තු නිකුත් කිරීමට නොහැකි වී ඇත. අද වන විට නිවැරදිව ලේඛන සකසා ගනිමින් කේ පෝරම නිකුත් කර ඉදිරියේදී නීතිමය කටයුතු සිදු කළ හැකිය.
දීර්ඝ කාලීනව බදු දුන් දේපළ සියල්ල සඳහා ගිවිසුම්ගත වී කටයුතු අවසන් කර නොතිබුණි	නැවත දේපල තක්සේරුවක් සිදු කර සියලු බදු දුන් දේපල සඳහා ගිවිසුම් ගත වීම් කරගෙන යන ඇත.

දෙවන කොටස - **52.00**	
ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	වාර්ෂික සැලසුම මගින් තිරසර අරමුණ හඳුනාගෙන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ඇත.
හඳුනාගත් තිරසර අරමුණු ඉටුකර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි.	වාර්ෂික ක්‍රියාකාරී සැලසුම තුළ හඳුනාගත් අරමුණු හා ඉලක්ක සඳහන්ව ඇත. 2025 2026 වර්ෂය.
හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි.	තිරසර සංවර්ධන අරමුණු සෑම වැඩසටහනක් සඳහාම හඳුනාගෙන ඇත.
ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර නොතිබුණි	වාර්ෂික සැලැස්ම තුළ ජාතික ප්‍රතිපත්තින්ද ඇතුළත් කරමින් සකසා ඇත.
වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි.	වාර්ෂික ගැසට් නිවේදනය මගින් බදු පැනවීමේ ගැසට් පත්‍රය තුළ ගාස්තු අය කිරීම පිළිබඳව සඳහන් කර ඇත.
මහා නගර සභා ආඥා පනතේ 272 වගන්තිය/නගර සභා ආඥා පනතේ 157 වගන්තිය/ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	පොදු අතුරු ව්‍යවස්ථා 32ක් වලංගුගෙන ඇත. නැවතත් පැනවූ අ අතුරු පැනවූ අ අනතුරු ව්‍යවස්ථා පහක් සහ සභා සම්මතයෙන් සමදේන් වෙළඳගෙන ඇත.
ආයතනයේ පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ආයතනය තුළ තොරතුරු ලබා ගැනීමට හා යෝජනා වෝදනා ඉදිරිපත් කිරීම සඳහා පැමිණිලි පෙට්ටියක් පොදුවේ තබා ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුනි.	වර්තමානයේදී පුහුණු අවස්ථා ලබා දීම් සිදුකරයි
2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මූදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	ආයතනය විසින් කාර්ය සාධක දර්ශක වාර්ෂික සැලසුම තුළ හඳුනාගෙන කර ඇත. එය ප්‍රමාණාත්මකව 8 කි.

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ආයතනයේ නම : වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගෙන ඇති දුර්වලතා	**දුර්වලතා මගහරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග හා වර්තමාන තත්වය**
පළමු කොටස :90.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය	ව්‍යාවන මට්ටමේ පවතී
ප්‍රධාන සංයුත සැලැස්ම පිළියල කර නොතිබුණි	පිළිගනිමි. අදාළ විෂයභාර නිලධාරීන් දැනුවත් කර ඇති අතර ඔහු විසින් අදාල කාලයක් තුල සභාවට සම්මත කරගැනීමට ඉදිරිපත් කර නොතිබුණි.
සංයුත සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කොට සභා සම්මත කර නොතිබුණි	
වර්ෂයට අදාළ බිල් කළ ආදායමෙන් අයකිරීම පහළ මට්ටමෙන් විය	පිළිගනිමි. ආදායම් රැස්කිරීමට කාර්ය මණ්ඩලයේ හිඟයක් බලපා ඇති බවත් නමුත් මේ වන විට ආදායම් පරීක්ෂකවරයාට අමතරව මාර්ග කම්කරු මහතෙක් ද යොදවා අයකිරීම් සිදු කරයි.
හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් කර නොතිබුණි	මේ සඳහා විධිමත්ව ක්‍රියාත්මක කිරීමට නිලධාරින්ගේ දැනුම හා හිඟය බලපා ඇත.
ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවරීමක් සිදු කර නොතිබුණි	පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට අදාළ විෂයභාර නිලධාරීන් දැනුවත් කර ඇත.
දෙවන කොටස : 52.00	
ආයතන පිළිබඳව මහජනතාවට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි	පිළිගනිමි. වෙබ් අඩවියක් නිර්මාන කිරීම සඳහා අදාළ නිලධාරියාව දැනුවත් කර ඇත..
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රසංශා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි	වෙබ් අඩවිය නිර්මාණය කිරීමෙන් පසු අවස්ථාව සලසා දීමට අපේක්ෂා කර ඇත.
ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	අඩු පාඩුවක් තිබුණ බව පිළි ගන්නා අතර ඉදිරියේ දී නිවැරදි කිරීමට අපේක්ෂා කරමි.
හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කරගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි	මෙම වර්ෂය තුළ නිවැරදි කර ගැනීමට අදාල නිලධාරින් දැනුවත් කර ඇත.
හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා ජයග්‍රහණ දර්ශක නියම කර නොතිබුණි	තිරසර සංවර්ධන අරමුණු මැන බැලීමට අවශ්‍ය දර්ශක පිළිබඳ අදාල නිලධාරින් දැනුවත් කර ඇත.

ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස්කිරීමට වැඩ පිළිවෙලක් නොතිබුණි	සභා බලප්‍රදේශය තුල අත්පත්‍රිකාව නිකුත් කර මහජනතාවට දැනුවත් කර ඇත.
කසල අපහරණය කිරීම / කසල කළමනාකරණය කිරීම සඳහා සභාව විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි	පිළිගනිමි. කාර්ය මණ්ඩලයේ හිඟයක් බලපා ඇති නිසා ක්‍රියාත්මක කර නොතිබුණි.
වරිපනම් කලාපය ඇතුලත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි	මේවනවිට හඳුනාගත් ආයතන 3 ක් මගින්, එකතු කරන කසලවලින් ගාස්තු අය කර ඇත.
ප්ලාසිටික් හා පොලිතින් ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීමේ සංවිධානාත්මක වැඩපිළිවෙලක් නොතිබුණි	පිළිගනිමි. අප සභා බල ප්‍රදේශය තුළ මහා පරිමාණයෙන් කරනු ලබන ව්‍යාපාර ස්ථාන නොමැති වීම හේතුවෙන් රැස්කරනු ලබන අපද්‍රව්‍ය සඳහා මුදල් අයකර නොතිබුණ අතර ඉදිරියේදී මේ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අදාල නිලධාරියා දැනුවත් කර උපදෙස් ලබාදී ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% වඩා අඩු මට්ටමකද පැවතුණි	පිළිගනිමි. 2024 වර්ෂයේදී සැලසුම්ගත පුහුණු අවස්ථා අනුව පුහුණු ලබා දී ඇත.
2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛනයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක තුනක් හඳුනාගෙන නොතිබුණි	පිළිගනිමි. මෙම කාර්යසාධක දර්ශක පිළිබඳව මේ වන විට කාර්ය සාධක දර්ශක හඳුනාගෙන ඇත.

ආකෘති (අංක. 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ආයතනයේ නම : හලාවත ප්‍රදේශීය සභාව

චාර්තා මඟින් හඳුනාගෙන ඇති අඩුපාඩු	**අඩුපාඩු මඟහරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති පියවර / වත්මන් තත්වය**
පළමු කොටස : 82.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අභිතකර මට්ටමේ විය.	2023 වර්ෂයේ ගිණුම පිළිබඳ විගණන මතය තත්වාගණනය කළ මතය විය.
මෘදුකාංගයට අදාළ මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	CAT මෘදුකාංගයට අදාළ මුරපද වයඹ සංවර්ධන අධිකාරිය දැනුවත් කර මාස තුනකට වරක් වෙනස් කිරීමට කටයුතු කිරීමට කටයුතු කරන බව දන්වමි.
ප්‍රධාන සංයුත සැලැස්ම පිළියල කර නොතිබුණි.	නියමිත දින වන විට අදාළ සංයුත සැලැස්ම අනුමත කර ගෙන ඇති බව දන්වමි.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක් වත් පවත්වා නොතිබුණි.	දැනට කාර්තුවකට 01 බැගින් කාර්තු 04 සඳහා විගණන හා කළමනාකරණ කමිටු පවත්වනු ලැබේ.
බැංකු සැසඳුම් ප්‍රකාශන වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	2023 වර්ෂයේ මුල් මාස 02 හි බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දිනට සකස් කර නොතිබූ අතර මේ වන විට එම වාර්තා නියමිත දිනට සකස් කරමින් මු.රෙ.අනුව කටයුතු කරමින් පවතී.
වර්ෂයට අදාලව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	වර්ෂයේ බිල් කළ ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් (40%) මුද්දර ගාස්තු හා උසාවි දඩ මඟින් නියෝජනය වන අතර ඒවා මේ වන විට ක්‍රමයෙන් අයවෙමින් පවති.
දීර්ඝ කාලීනව බදු දුන් දේපළවලින් වාර්ෂිකව අයකළ යුතු බදු කුලී අය කරගෙන නොතිබුණු අවස්ථා විය.	වරිපනම් හැර දීර්ඝ කාලීනව බදු දුන් දේපළ වල කුලී ආදායම් සෙසු ආදායම් උපලබ්ධිවීම ප්‍රශස්ථ මට්ටමක පවතී. විවිධ වැඩසටහන් මඟින් හිඟව පවතින වරිපනම් ද ක්‍රමයෙන් අයකරගෙන යනු ලැබේ.
දෙවැනි කොටස : 72.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	2023 වර්ෂයේදී වෙබ් අඩවියක් නිර්මාණය කර නොතිබූ අතර ඉදිරියේදී වෙබ් අඩවියක් නිර්මාණය කර මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දීම සිදු කරනු ලබන ලැබේ.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	

ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩපිළිවෙලක් නොතිබුණි.	අපද්‍රව්‍ය සංයුතිය තුළ පවතින පහත සඳහන් අපද්‍රව්‍ය සඳහා පළාත් පාලන ආයතන තුළ තිරසාර විසඳුම් නොමැත. ❖ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ❖ උපද්‍රව කාර අපද්‍රව්‍ය ❖ සායනික හා පර්යේෂණ අපද්‍රව්‍ය ❖ ගෘහස්ථ සායනික අපද්‍රව්‍ය ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය සංයුතිය ඉතා සංකීර්ණ වන අතර සමහර ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය සඳහා පිරියම් ක්‍රම අපරට තුළ නොමැති අතර ඒවා පිරියම් කිරීමට වෙනත් රටකට යැවිය යුතුවේ. බොහොමයක් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කරනු ලැබුවද, ඒවා බැහැර කර ගත නොහැක. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය මධ්‍යම පරිසර අධිකාරිය මඟින් එක්රැස්කරනු ලබන අතර එම ආයතන ප්‍රකාශයට පත් කරනු ලබන දින 2-3 ක් තුළ පමණක් එම එක්රැස් කිරීම සිදු කරනු ලබයි. ප්‍රාදේශීය සභාවට විධිමත් ගබඩා පහසුකම් නොමැතිවීම නිසා ඒවා තබා ගැනීම මඟින් බරපතල පාරිසරික හානි සිදුවිය හැකිය. මේ වන විට හලාවත ප්‍රාදේශීය සභාවට ලැබී ඇති ද්‍රව්‍ය ප්‍රතිසාධන මධයස්ථානය (MRF) Centre තුළ විධිමත් ගබඩා පහසුකම් සලසා ගත හැකි බැවින් එම මධ්‍යස්ථානය සම්පූර්ණ වූ මෙම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කිරීමට සැලසුම් කර ඇත. එසේම පළාත් පාලන ආයතන වල ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තිරසාර විසඳුමක් යෝජනා කර නොමැති අතර මේ වන විට පුස්තකාල, පෙර පාසල්, පාසල් හරහා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීමක් සිදු නොකරන ලෙස දැනුවත් කිරීම සිදු කර ඇත.
වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කර නොතිබුණි.	2026/2027 වර්ෂය සඳහා වරිපනම් කලාප ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අය කිරීම සඳහා අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් සිටී.
පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු සියලු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.	කොරෝනා රෝගය හේතුවෙන් කර්මාන්ත විශාල සංඛ්‍යාවක් නවතා දමා ඇත. සිහිකැඳවීම් ලිපි මඟින් කර්මාන්තකරුවන් වෙත පරිසර ආරක්ෂණ බලපත්‍ර අලුත්කිරීමට දැනුම්දී ඇත. මේ වන විට

	බලප්‍රදේශයේ පවත්වා ගෙන යනු ලබන කර්මාන්ත සඳහා බලපත්‍ර ලබාදීමට කටයුතු කරමින් සිටී.
අතුරු ව්‍යවස්ථා පරිශීලනය කිරීම සඳහා මහජනතාවට ප්‍රවේශයක් සලසා දී නොතිබුණි.	මේ වන විට සභාවේ විෂය ප්‍රමාණවත් වන සම්මත අතුරු ව්‍යවස්ථාවන් වැලදගෙන ඒ පරිදි කටයුතු කරන අතර ඉදිරියේදී ඒවා මහජනතාවට පරිශීලනය කිරීම සඳහා ප්‍රවේශයක් සකස් කිරීමට නියමිතය.
ආයතනයේ පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව අධීක්සණය කිරීම අංශ ප්‍රධානීන් වෙත පවරා ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථා වලින් ලබාදි තිබු පුහුණු අවස්ථා ප්‍රමාණට 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	ආයතනික මෙන්ම බාහිර ආයතනවලින් ලැබෙන පුහුණු ලෙස පුහුණු වෙන්කර ඇති අතර නිලධාරින්ගේ ඉල්ලීම පරිදි පුහුණු අවශ්‍යතා ලබාදෙන අතර 2023 වර්ෂයේදී පුහුණු ඉල්ලුම් කිරීම අඩුමට්ටමක පැවති බැවින් පුහුණු අවස්ථා 50% අඩු මට්ටමක පැවතුනි.
සියලු නිලධාරින් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට නිවැරදි කර ඇත.
වත්කම් ප්‍රකාශ ඉදිරිපත් නොකළ අදාළ නිලධාරි පිළිබඳ ආයතන ප්‍රධානියා විසින් උචිත බලධාරයා දැනුවත් කර නොතිබුණි.	

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන අංකය :- 492
ආයතනයේ නම :- නවගත්තේගම ප්‍රාදේශීය සභාව

කමිටු විසින් හඳුනාගන්නා ලද දුර්වතා	**දුර්වතා මඟ හරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය.**
පළමු කොටස : 90.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය	තත්වාගණනය කල මතයක් ලැබී ඇත.
ගල් හා බොරලු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	වර්තමානයේ ගල් හා බොරලු ලේඛනයක් සකස් කර ඇත.
විගණන කලමණාකරන කමිටු රැස්වීම් වාර 4වත් පවත්වා නොතිබුණි.	පිලිගනිමි.ඉදිරි වර්ශවල කාර්තුවට එක බැගින් පැවැත්වීමට කටයුතු කර ඇත.
වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදි අපහරනය කර නොතිබුණි.	අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව නිසි කවයුතු කර නොතිබුණි.	
සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි	
ආයතනය පිලිබඳව අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.	වෙබ් අඩවියක් නිර්මාණය කරමින් පවතී.
දෙවන කොටස : 75.00	
ආයතනයේ පවත්වාගෙන යනු ලබන මහජන පැමිනිල්ලක් හෝ ප්‍රශංසා සටහනක් කිරීම සඳහා අවස්ථාවක් සලසා දී නොතිබුණි.	මහජන පැමිනිල්ලක් හෝ ප්‍රශංසා ලබා ගැනීම සඳහා Facebook ගිණුමක් හා WhatsApp ගිණුමක් ආරම්භ කර ඇත.
සභා ප්‍රදේශයේ කසල වෙන් කර ලබා ගැනීමක් සිදු නෙවේ.	කසළ කළමණාකරණය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර උපකරණ නොමැති වීම.
ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිලිවලක් නොතිබුණි.	
කසල අපහරනය කිරීම /කසල කලමනාකරනය කිරීම වැඩ පිලිවලක් නොතිබුණි.	වන අලි ප්‍රශ්ණය නිසා.
වරිපනම් කලාපය ඇතුලත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රවය ගාස්තු අයකරන වැඩපිලිවලක් නොමැති වීම.	නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් දියුනු ගම් ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශය තුල වරිපනම් පැනවීමේ දී ප්‍රතිශතය තීරනය කිරීම සඳහා කසල ඉවත් කිරීමට අදාල ගාස්තු ඇතුලත් කර ඇති

	බැවින් ඒ මත නැවත ගාස්තු අය කිරීමට කටයුතු කර ත.
ප්ලාස්ටික් සහ පොලිතින් ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීමේ සංවිධානාත්මක වැඩපිළිවලක් නොතිබුණි.	කසළ කළමණාකරණය කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර උපකරණ නොමැති වීම.
මහා නගර මහා ආඥා පනතේ 272 වගන්තිය /නගර සභා ආඥා පනතේ 157 වගන්තිය / ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.	126 පනතේ ප්‍රාදේශීය සභව විස්තර් සකස් කර පනවා ගත් අතුරු ව්‍යවස්ථා නොමැති අතර අමාත්‍යවරයා විසින් පිලියෙල කර ප්‍රකාශයට පත් කර ඇති අතුරු ව්‍යවස්ථා නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් පිලිගෙන ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථාවලින් ලබා දී තබු පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුනි.	පිළිගනිමි.වැඩසටහන් 5ක් කිරීමට උපදෙස් දී ඇති නමුත් එවකට සිටි නිලධාරින් වැඩසටහන් 2ක් පමනක් කර ඇති බව අනාවරනය විය.

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 492

ආයතනයේ නම : ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව

කමිටුව විසින් හඳුනාගන්නා ලද දුර්වලතා	**දුර්වලතා මඟ හරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්ත්වය**
දෙවන කොටස - 93.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අභිතකර මට්ටමේ විය.	2023 වර්ෂය සඳහා තත්වාගණනය කළ මතයක් ලැබී ඇත.
2023 වර්ෂයට ආදාලව බිල් කල ආදායමෙන් අය කිරිම පහල මට්ටටක විය.	2023 වර්ෂයට ආදාලව රු.9,545,862.99 ක භිග හා ප්‍රවර්තන ලැබීම් අය කරන ලදි.
භිග වරිපනම් අයකර ගැනිම සඳහා වරෙන්තු නිකුත් කිරිමක් කර නොතිබුණි .	2023 වර්ෂය සඳහා බිල් කල ආදායම රු.6,095,046.96 වන අතර එම මුදලින්ප්‍රවර්ථන ලැබීම් ලෙස රු.2,543,431.68 ක මුදලක් අය කර ඇත. 2023 වර්ෂයේ භිග ලැබීම් ලෙස (ක්ෂේත්‍ර භිග වැඩසටහනක් රතු නිවේදන මගින්) රු.7,002,431.31 ක භිග මුදලක් අය කර ගැනිම කටයුතු කරන ලදී. එම අය කල භිග වරිපනම් මුදලින් වරෙන්තු හා රතු නිවේදන රු.1,350,628.62 ක පමණ මුදලක් (ආසන්න මුදලක්)නිකුත් කර වරිපනම් අය කර ගැනිමට කටයුතු කරන ලදි.ඒ අනුව වරෙන්තු (රතු නිවේදන) නිකුත් කිරිම 2023 වර්ෂයේ සිදු කරන ලදී.
වාර්ෂික ටෙන්ඩර් මත බදු දුන් සියලුම දේපල සඳහා අය විය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අය අය කර නොතිබුණි.	පෙර වර්ෂ සඳහා නඩු පැවරිමට කටයුතු කර තිබුණද ආදාල නීතිඥවරයා විසින් ඇතැම් නඩු පිලිබදව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබිම හේතුවෙන් 2025.05.19 වන දින පැවති මුදල් කමිටු තීරණය අනුව නීතිඥ එම් .ඩබ් .ඒ සී. ස්විනි පෙරේරා මහතා තෝරාගෙන ඇති අතර දැනට ඒම නීතිඥවරයා යටතේ 2023 වර්ෂයට ද ආදාල දේපල බදු ගැනුම්කරුවන් හට නීතිමය කටයුතු සිදු කෙරෙමින් පවති.
දෙවන කොටස : 85.00	
ආයතනය පිළිබදව වෙබ් අඩවියක් නිරිමාණය කර මහජනයාට අවශය තොරතුරු ලබා ගැනිම සඳහා වෙබ් අඩවි නිරිමාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි	මේ වන විට නිරිමාණශිලි හා ආකර්ශණිය WEB පිටුවක් නිර්මාණය කිරිම සඳහා සැපයුම් නිලධාරි කටයුතු කරමින් පවති.

ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවි මගින් මහ ජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	මේ වන විට නිරීමාණශිලි හා ආකර්ශණිය WEB පිටුවක් නිර්මාණය කිරීම සඳහා සැපයුම් නිලධාරි කටයුතු කරමින් පවති.
ඉලෙක්ට්‍රොනික්අපද්‍රව්‍ය වෙනම රැස් කිරීමට වැඩ පිලිවෙලක් නොතිබුණි.	නොදිරන කසල මධ්‍යස්ථානයක් මේ වන විට ඉදි කර ඇති බැවින් ඉලෙක්ට්‍රොනික් අපද්‍රව්‍ය සඳහා කුටියක් වෙන් කිරීමට නියමිතයි.
වරිපනම් කලාපය ඇතුලත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්ත අය කර නොතිබුණු.	වරිපනම් කලාපය ඇතුලත වෙළඳබලපත්‍ර ව්‍යාපාර බදු ,කර්මාන්ත බදු,අය කරන බැවින් කාල සටහනකට අනුව සේවාවක් වශයෙන් කසල දිරණ හා නොදිරන ලෙස වෙන් කර ලබා ගැනිම සිදු කරයි.

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය **:492**

ආයතනයේ නම **: ආණමඩුව ප්‍රාදේශීය සභාව**

කමිටුව මගින් හඳුනාගත් දුර්වලතා	**එම දුර්වලතා නිවැරදි කිරීම සඳහා ආයතනය මගින් ගත් ක්‍රියාමාර්ග/වර්තමාන ප්‍රගතිය**
පළමු කොටස : 92.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාචන මට්ටමේ/ අභිතකර මට්ටමේ විය.	2024 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙළ කිරීමේදි ,2023 වසරේ තත්වාගණනය කළ මතයට හේතුවූ සියළු කරුණු නිවැරදි කර ඇත.
වර්ෂයට අදාලව බිල් කළ ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.හිඟ වරිපනම් අයකර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කිරීමක් කර නොතිබුණි.	2023 වර්ෂයේ ආදායම් පරීක්ෂක තනතුරු 03 ක් පැවති නමුත් කිසිදු ස්ථිර ආදායම් පරීක්ෂක වරයෙකු නොමැතිවීම තුළ තාවකාලික පදනම යටතේ ප්‍රාථමික ශ්‍රේණියක සේවකයකු ආදදායම් පරීක්ෂක වශයෙන් සේවයේ යොදවා ගෙන වෙළඳ බල පත්‍ර /සමීක්ෂණ කටයුතු සහ වරිපනම් රැස් කිරීමේ කාර්යය ඉටු කරවා ගන්නා ලදී. ගම් උදාව ප්‍රදේශයේ පැවති ඉඩම් ගැටළු නිසා එහි හිමි කාරිත්වය නීත්‍යානුකූලව ලබා දී නොමැති බැවින් එහි පදිංචි කරුවන් විසින් වරිපනම් බදු ගෙවීම සිදු නොකරන ලදී.දැනට මේ පිළිබඳ ඉඩම් කච්චේරියට යොමුකර අවශ්‍ය නීතිමය කටයුතු ඉටුකරමින් ඇත.තවද රතු නිවේදන නිකුත් කිරීම සිදු කළත් ස්ථිර ආදායම් පරීක්ෂකවරයෙකු නොමැති බැවින් දේපළ තහනම් කිරීමේ කාර්යය සිදු නොකරන ලදි.එබැවින් හිඟ ආදායම් රැස්කිරීමේ ක්‍රියාවලිය දුර්වල මට්ටමක පැවතුණ බව දන්වමි.
දෙවන කොටස : 92.00	
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	ආයතනය පිළිබඳ මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා මේවනවිට වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වා ගන යනු ලබයි.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	එමෙන්ම මෙම වෙබ් අඩවිය හරහා මහජනයාට ස්වකීය අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමේ අවස්ථාව සළසා දී ඇත.
වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථාන වලින් හා ආයතන වලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අයකර නොතිබුණි.	වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථානවලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් කසළ බද්ධ 2026 වසරේ සිට පනවා අය කිරීමට කටයුතු කර ඇත.
ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	මේවනවිට ආයතනයේ පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට ක්‍රමවේදයක් සකස්කර ඇත.

ආකෘති අංක 01

පාර්ලිමේන්තු ශ්‍රේණි අංකය : 492
ආයතනයේ නම : පුත්තලම ප්‍රාදේශීය සභාව

වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩුව	ඔබගේ අඩුපාඩුව නිවැරදි කිරීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය
පළමු කොටස : 91.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ /ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂය සඳහා තත්වාගණනය කළ මතයක් ලැබී ඇත.
දෙවන කොටස : 95.00	
ගල් හා බොරළු ලේඛනය නිසි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මේ වන විට ගල් හා බොරළු ලේඛනය යාවත්කාලීන කර ඇත.
මෘදුකාංගයට අදාල මුර පද තුන් මසකට වරක් වෙනස් කර නොතිබුණි.	මෘදුකාංග මුරපද නියමිත පරිදි වෙනස් කරනු ලැබේ.
විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04 ක්වත් පවත්වා නොතිබුණි.	දක්වා ඇති වර්ෂය තුළ විගණන හා කළමනාකරණ රැස්වීම් 03 ක් පවත්වා ඇත.
වාර්ශික ටෙන්ඩර් මත බදු දුන් සියළු දේපල සඳහා අයවිය යුතු සියළු බදු මුදල් පූර්ණ ලෙස අයකර නොතිබුණි.	හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.
ව්‍යාපාර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා නඩු පැවරීමක් සිදු කර නොතිබුණි.	ඉදිරියේදී නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සූදානම් කර ඇත.
ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර නොතිබුණි.	ඉදිරියේදී වෙබ් අඩවියක් නිර්මාණය කිරීමට කටයුතු කරනු ඇත.
ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රසංශා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	E-sabha වෙබ් අඩවිය හරහා මහජන පැමිණිලි හෝ ප්‍රසංශා සටහන් කිරීමට අවස්ථාව සලසා ඇත.
වරිපනම් කලාපය ඇතුළත ව්‍යාපාරික ස්ථානවලින් හා අයතනවලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අයකර නොතිබුණි.	ව්‍යාපාරික ස්ථානවලින් හා අයතනවලින් රැස් කරනු ලබන අපද්‍රව්‍ය වෙනුවෙන් ගාස්තු අයකර කිරීම ආරම්භ කර ඇත.

ආකෘතිය අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාවේ අංකය - 492

ආයතනයේ නම - වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

වාර්තාවේ හඳුනාගත් අඩුපාඩු	**අඩුපාඩුව නිවැරදි කිරීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග වල වර්තමාන තත්ත්වය**
පළමු කොටස 96.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය,යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ/අහිතකර මට්ටමේ විය.	2023 වර්ෂය සඳහා යටත්ව මට්ටමේ විගණන මතයක් ඉදිරිපත්වී තිබුණි.අදාල මතය සඳහා හේතු වූ අඩුපාඩු විගණනය විසින් පෙන්වා දී තිබූ අතර එම අඩුපාඩු නිවැරදි කර අවම කර ගෙන ඇත.
දීර්ඝ කාලීනව බදු දුන් දේපලවලින් වාර්ෂිකව අයකළ යුතු කුලී අය කරගෙන නොතිබුණු අවස්ථා විය	2023 දීර්ඝකාලීනව බදු දුන් දේපලවලින් අයවිය යුතුව තිබූ බදු කුලී නිරවුල් කිරීමට කටයුතු කර ඇත.
දෙවන කොටස 98.00	
පළාත් පාලන ආයතනයෙන් පරිසර බලපත්‍ර ලබාගත යුතු සියළු ආයතන පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි	සමීක්ෂණයක් සිදුකර පරිසර බලපත්‍ර ලබාගෙන නොමැති ආයතනවලට පරිසර බලපත්‍රය ලබාගන්නා ලෙසට දැනුවත් කර,පරිසර බලපත්‍රය ලබා ගැනීමට කටයුතු නොකරන ව්‍යාපාර ආයතන සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

ආකෘති (අංක. 01)

පාර්ලිමේන්තු මාලා අංකය : 492

ආයතනයේ නම : නාත්තන්ඩිය ප්‍රදේශීය සභාව.

වාර්තා මඟින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු මහහරවා ගැනීමට ආයතනය විසින් ගෙන ඇති පියවර / වත්මන් තත්වය
පළමු කොටස : 95.00	
ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය	තත්වාගණනය කළ විගණන මතයක් ලැබී ඇත.
වර්ෂයට අදාල බිල්පත් ආදායමෙන් අය කිරීම පහළ මට්ටමක විය.	2023 වර්ෂයට අදාලව බිල් කළ ආදායමෙහි කඩ කුලී , බදු කුලි හා ජල ගාස්තු යන ආදායම් සැලකිය යුතු ප්‍රතිශතයකින් 2024,2025 වර්ෂ වලදි අය කර ඇත. වරිපනම් බදු අය කිරීම සඳහා ජංගම සේවා වැනි වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කර ඇති අතර 2023 වර්ෂයේ හිඟ මුදලින් 40% පමණ ප්‍රතිශතයක් අය කරගෙන ඇත. මේ වන විට සියලු ආදායම් එකතු කිරීමේ නිලධාරීන් දැනුවත් කර හිඟ ආදායම් රැස් කිරීම සඳහා හිඟ මුදල බෑන්ඩ ගත කරමින් (10,000 ට වැඩි, 5,000 ට වැඩි, 5,000 ට අඩු ලෙස) අය කර ගැනීම සඳහා පියවර ගෙන ඇත. ඉදිරියේදී දේපල තහනම් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටද සැලසුම් කර ඇත.

2024/03/04

අයි.එම්.අයි. ඉලංගකෝන්
ප්‍රධාන ලේකම්
වයඹ පළාත